# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008.07.31

වේලාව : පෙ.ව.10.30

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු උපසභාපති - සුමේද චමින්ද බස්නායක මැතිතුමා
03. ගරු නගර සභා මන්ත්‍රී- ධර්මසේන සමරසිංහ මැතිතුමා.
04. ගරු නගර සභා මන්ත්‍රී- ඊ.ජී.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
05. ගරු නගර සභා මන්ත්‍රී- ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
06. ගරු නගර සභා මන්ත්‍රී- එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
07. ගරු නගර සභා මන්ත්‍රී- විමලසේන වැවේගෙදර මැතිතුමා.
08. ගරු නගර සභා මන්ත්‍රී- යූ.එච්.ගාමිණී මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. නාගරික ලේකම් - ආර්.ඩී.නලින් පුෂ්ප කුමාර මහතා

**සහභාගීනොවූවෝ:-**

01. ගරු නගර සභා මන්ත්‍රී - එම්.ටී.එම්.රූමි මැතිතුමා

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

2008 වර්ෂයේ ජූලි මාසයට අදාළ සභා රැස්වීම අද දින පැවැත්වෙන බවත්, ඒ සදහා සහභාගිවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා,ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම්තුමා හා පුවත්පත්කලාවේදී මහතුන් ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගනිමින් සභාවේ වැඩ කටයුතු කරගෙන යාමට ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

(03). **2008.06.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2008.06.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

04. <u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:</u>

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවිය.

05. <u>සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:</u>

05:01 <u>පිළිසරු ව්‍යාපෘතිය:</u>

උක්ත කරුණට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බලන්ගොඩ නගර සභාව විසින් පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වාර්තාව අනුමත වී ඇති අතර, මෙමගින් බැංකියවත්ත කසල මධ්‍යස්ථානයේ ඉතිරි කොටස එනම්, අඩි 70 ක් පළලට හා අඩි 300 ක් දිගට බිම කොන්ක්‍රීට් කර වහලක් ඉදිකිරීමට යෝජනා කර ඇති බවත්, කසල වෙන් කිරීමේ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති හෙයින්, මේ සඳහා මිලියන 12.2 වැය කිරීමට අපේක්ෂිත බවත් ඒ සඳහා සභාවේ අනුමැති අපේක්ෂා කරන බවත් එමගින් වාර්තා කර ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

ඉහත ඉදිකිරීම සිදුකිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ජී.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:02 <u>අභිනව තොරතුරු මධ්‍යස්ථානය වායු සමීකරණය කරගැනීම:</u>

බලන්ගොඩ නගර සභාව මගින් ආරම්භ කිරීමට නියමිත තොරතුරු මධ්‍යස්ථානයේ පරිඝණක 08 ක් පමණ තැබීමට සිදුව තිබෙන බැවින් එය වායු සමීකරණය කිරීම සඳහා පරිඝණක දත්ත සටහන් ක්‍රියාකරුගේ ඉල්ලීම අනුව කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිල ගණන් පිළිගෙන අදාල කාර්යය ඉටුකරගැනීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:03 <u>බලන්ගොඩ බස්නැවතුම්පල - නි.තැ.කා.</u>

උක්ත කරුණට අදාළව, රත්නපුර ප්‍රාදේශීය තැපැල් අධිකාරි විසින් එවා ඇති අංක: උග්‍රාතැඅ(රත)7974/07 හා 2008ජ07.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එමගින් පහත සඳහන් කරුණු සභාවේ අවධානයට ලක්කර ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

ඉහත කී ස්ථානයේ නියෝජිත තැපැල් කාර්යාලයක් ආරම්භ කිරීම පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් අනුමත කර ඇති බවත්, ඒ සඳහා සුදුසු නියෝජිතයෙකු ඉදිරිපත් කරන ලෙසත්, අදාල මුදල තැන්පත් කරන ලෙසත්,දන්වා එවා ඇතත්, මෙතෙක් ඒ සඳහා පිළිතුරු නොලැබුණු බවත්, පෞද්ගලික නියෝජිත තැපැල් කාර්යාලයක් වෙනුවට සණස නියෝජිත තැපැල් කාර්යාලයක් ආරම්භ කිරීමට හැකියාව තිබේ නම්, රු.3000/- ක් තැන්පත් කර ඊට අදාල කටයුතු ඉටුකරන ලෙස දන්වා තිබිණ.

මේ සම්බන්ධව බලන්ගොඩ සණස කාර්යාලයෙන් විමසීමක් කිරීමට තීරණය කරන ලදී.

05:04 <u>බලන්ගොඩ බුලත්ගම පොදු සුසාන භූමිය සංවර්ධනය කිරීම:</u>

බලන්ගොඩ නගර සභාවට අයත් බුලත්ගම පොදු සුසාන භූමියේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා,මෘතදේහ මිහිදන් කිරීමේ දී විවිධ ගැටළු වලට මුහුණ පෑමට සිදුව තිබෙන බැවින්, පැරණි සොහොන් කොත් කඩා ඉවත් කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලමින් සුසාන භූමිකම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා නිර්දේශ සහිතව සභාගත කරන ලදී.

සුසාන භූමිය සංවර්ධනය කිරීම අවශ්‍ය වී ඇති බැවින්, පුවත්පත් දැන්වීමක් පළකර මහජනතාවගේ අදහස් විමසීමට තීරණය විය. වසර ගණනාවක් පැරණි සොහොන් කොත් කඩා ඉවත් කිරීමට ගරු අධිකරණයේ අවසරය ලබාගැනීමට ද තීරණය විය.

05:05 <u>හුණුකුඹුර ජල යෝජනා ක්‍රමයෙන් ජලය ලබාගැනීම:</u>

උක්ත කරුණට අදාළව බලන්ගොඩ හුණුකුඹුර රත්ඔිවිට පාර අංක: 282/ඒ දරන ලිපිනයේ පදිංචි එස්.එම්.ධර්මසේන යන අය විසින් එවා ඇති 2008.07.30 දිනැති ලිපිය සභාගත කරන ලදුව, අදාල අය කැඳවා සාකච්ජා කිරීමට තීරණය කරන ලදී.

05:06 <u>පැරණි නාම පුවරුව ඉවත් කිරීම සම්බන්ධවයි:</u>

කොළඹ - බදුල්ල ප්‍රධාන මාර්ගයේ තමාගේ වෙළඳසල අසල බලන්ගොඩ නගර සීමාව සටහන් කිරීම සඳහා වු නාම පුවරුවක් සවිකර ඇතිබවත්,මෑතක දී නගර සභා සීමාව පුළුල් කිරීම නිසා එම පැරණි නාම පුවරුවත් කිසිදු ප්‍රයෝජනයක් නොමැති බවත්, එබැවින්, එම නාම පුවරුව එම ස්ථානයෙන් ඉවත් කරන ලෙස ඉල්ලා බලන්ගොඩ,ඇල්ලෙපොල,මාලිගාතැන්න වෙළඳසල යන ලිපිනයේ පදිංචි ජී.ආරියසේන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීමට තීරණය කරන ලදී.

05:07 <u>කොන්ක්‍රීට් මිශ්‍රවරය ලබාගැනීම:</u>

තලංගම හරහා පහලගම දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රිට් කිරීම සඳහා කොන්ක්‍රිට් මිශ්‍රවරය ලබාදෙන ලෙස ඉල්ලමින්, තලංගම පැරකුම් ගොවි සංවිධානයේ සභාපති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සම්බන්ධව පසුව සලකා බැලීමට තීරණය කරන ලදී.

06. <u>මුදල් ගෙවීම් අනුමත කිරීම:</u> ( රු.10000/- ට වැඩි ගෙවීම්)

| | |
|---|---|
| වතුර මෝටරයක් මිළදි ගැනීම. | රු.31324.59 |
| 02. ග්‍රාම සංවර්ධන සමිතිය,කිරිදිගල ඕපගන්තොට රබර්වත්ත ,ඉහලගම ගුණපාල මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරීම කර්මාන්තයේ අවසන් කොටස් මුදල් ගෙවීම. | රු.195369.54 |
| 03. සභාපති,තලංගම පැරකුම් ගොවිසංවිධානය ඇල්ලෙපොල,මාලිගාතැන්න කඩේ අසලින් ඉහල පාර සරස්වතිවත්ත පාරට සම්බන්ධවන පාර කොන්ක්‍රිට් කිරීම කර්මාන්තයට අත්තිකාරම් මුදලක් ගෙවීම. | රු.100000.00 |

04. සාමාන්‍යාධිකාරී,සි.ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.06.09 සිට 2008.06.10 දක්වා ඉන්ධන
බිල්පත් පියවීම. රු.56760.00

05. සාමාන්‍යාධිකාරී,සි.ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.05.23 සිට 2008.06.08 දක්වා ඉන්ධන
බිල්පත් පියවීම. රු.70795.00

06. දේශිය ආදායම් කොමසාරිස්
රදවා ගැනිමේ බදු මුදල් ගෙවීම. රු. 15856.71

07. ඊ.ජී.චන්ද්‍රරත්න මහතා
පොහොර හැලීමේ දිමනා ගෙවිම. රු. 10000.00

08. ශ්‍රී ලංකා ටෙලිකොම්
060-247115 දුරකථනයේ 2008.03.15 දක්වා
හිඟ බිල්පත් හා නැවත සම්බන්ධ කිරීමේ
ගාස්තු ගෙවීම. රු. 17087.54

09. ඩැක්ස් ඉංජිනියරින්
බොබ් කැට් යන්ත්‍රය සඳහා ටයර්
02 ක් මිළදි ගැනිම. රු. 37570.50

10. දේශානි හාඩ්වෙයාර්
කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
මිළදි ගැනිම. රු. 17909.50

11. දේශානි හාඩ්වෙයාර්
නගර සභා උඩුමහලේ නාන කාමරය
ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිල දි ගැනිම. රු. 23441.50

12. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
පොලිසැක් බෑග්ස් මුද්‍රණය කිරිම
වෙනුවෙන් පුවත්පත් දැන්වීම රු. 11643.75

13. බී.ගුණරත්න මහතා
2008.06.16 - 2008.06.30 දක්වා
කැලි කසල එකතු කිරිම හා ප්‍රවාහන
ගාස්තු රු. 86500.00

14. එච්.පී.ගුණරත්න
වැලි කියුබ් 07 ක් මිළදි ගැනීම රු. 25180.00

15. එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්
ගල් සැපයිම වෙනුවෙන්මුදල් ගෙවිම. රු. 57410.50

16. සෙන්ට්‍රල් පොලිසැක් පුද්ගලික සමාගම
පොහොර ඇසුරුම් මලු මුද්‍රණය කිරීම. රු. 340500.00

17. සෙන්ට්‍රල් පොලිසැක් පුද්ගලික සමාගම
පොහොර ඇසුරුම් මලු මුද්‍රණය කිරීම. රු. 10965.00

18. මධුෂානි එන්ටර්ප්‍රයිසස්
කියවීම් ශාලාව ඉදිකිරීම කර්මාන්තයේ
ගෙවීම. රු. 55040.15

19. සාමාන්‍යාධිකාරී සි/ස.ඉඹුල්පේ
විවිධ සේවා සමුපකාර සමිතිය
2008.06.16 සිට 2008.06.23 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු. 67380.10

20. සාමාන්‍යාධිකාරී සි/ස.ඉඹුල්පේ
විවිධ සේවා සමුපකාර සමිතිය
2008.05.25 සිට 2008.06.16 දක්වා රු. 80167.40
ඉන්ධන බිල්පත් පියවීම.

21. නයිරුස් හාඩ්වෙයාර්
අමානෝ සිටි හා මුදුන් උළු සැපයීම. රු. 17840.00

22. ආනන්ද හාඩ්වෙයාර්
සිමෙන්ති මිටි 25 කට මුදල් ගෙවීම. රු. 20100.00

23. සීගිරි ප්‍රින්ටර්ස්
කුවිතාන්සි පොත් 100 ක් මුද්‍රණය කිරීම රු. 10650.00

24. එක්සත් නගර සභා සම්මේලනය
2007 හා 2008 වර්ෂ සඳහා සාමාජික
ගාස්තු රු. 10000.00

25. සිල් කම්පියුටර්ස්
පරිඝණක පද්ධති ඒකකයක් මිළදීගැනීම රු. 34600.00

26. එච්.ජී.පියසේන
බස්නැවතුම් ගාස්තු අයකිරීමේ කොමිස්
මුදල් ගෙවීම. රු. 20887.50

27. එල්.ඊ.සී.සී.මෙට්ල් ක්‍රෂර්
කර්මාන්ත අංශයට අවශ්‍ය ගල් මිළදී
ගැනීම.
රු. 41590.00

28. සාමාන්‍යාධිකාරී සි.ස.ඉඹුල්පේ.
විවිධ සේවා සමුපකාර සමිතිය.
2008.06.14 සිට 2008.06.30 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු. 235226.40

29. ඊ.ජී.චන්ද්‍රරත්න
පොහොර කිලෝ ග්‍රෑම් 10000 ක්
හැලීමේ ගාස්තු රු. 10000.00

30. බී.ගුණරත්න මහතා
2008.07.01-2008.07.15 දක්වා කැලිකසළ
ඉවත් කිරීමේ සේවය සඳහා ගෙවීම.
රු. 86500.00

31. ඒ.එච්.කේ.ආර්.චමින්ද
කියවීම් ශාලාව සඳහා අවශ්‍ය ඩෙස්,පුටු
සෑදීම සඳහා අත්තිකාරම් රු. 20000.00

32. කළමණාකරු,ලංකා බැංකුව,බලන්ගොඩ
ස්ථාවර තැන්පත් සඳහා මුදල් ගෙවීම. රු. 20000000.00

33. කළමණාකරු, ලංකා බැංකුව,බලන්ගොඩ
ස්ථාවර තැන්පත් වල කාලය දීර්ඝකිරීම රු. 10000000.00

34. සාමාන්‍යාධිකාරී, ල.වි.ම.
නව බස්නැවතුම්පල 2008 ජුනි මස විදුලි
බිල පියවීම. රු. 43215.60

35. සී.සී.කියැන්නැම් එන්ටර්ප්‍රයිසස්
බස්නැවතුම්පල හා ප්‍රධාන වීදිය යාකරන
මාර්ගයේ අතිරේක වැඩ කොටස් සඳහා
ඉතිරි මුදල ගෙවීම. රු. 598179.95

36. දේශීය ආදායම් කොමසාරිස්
ඉහත කර්මාන්තයේ වැට් බදු මුදල රු. 27439.45

37. සී.ස.කියැන්නැම් එන්ටර්ප්‍රයිසස්
යෝජිත සතිපොළ සඳහා ප්‍රවේශ මාර්ගය
ඉදිකිරීම. රු. 481262.24

38. දේශීය ආදායම් කොමසාරිස්
ඉහත කර්මාන්තයේ වැට් බදු මුදල රු. 22076.25

39. සී.ස.කියැන්නැම් එන්ටර්ප්‍රයිසස්
බස්නැවතුම්පල හා ප්‍රධාන වීදිය යාකරන
මාර්ගයේ අතිරේක වැඩ කොටස් වල ඉතිරි
මුදල ගෙවීම. රු. 830697.86

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

07. <u>ඇස්තමේන්තු අනුමත කිරීම:</u>

01. <u>මුගුණමලේ **iii** කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය:</u>

ජාතික සවිය ගම නැගුම 2008 වැඩ සටහන යටතේ උක්ත කර්මාන්තය සෘජු ශ්‍රමය මගින් ක්‍රියාත්මක කිරීමට ගරු සභාපතිතුමා වාචිකව උපදෙස් දෙන ලද අතර, කර්මාන්තයට අවශ්‍ය ද්‍රව්‍ය ඇණවුම් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින්, කාර්මික නිලධාරී මහතා විසින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දැණුම් දෙන ලදුව, සෘජු ශ්‍රමය දායක කරගනිමින් සභාව මගින් කර්මාන්තය ඉටුකිරීමට තිරණය කරන ලදී.

02. <u>කිරිමැටිතැන්න පුෂ්පා රංජනී මහත්මියගේ නිවස අසල පැති බැම්ම බැඳ පාලම ඉදිකිරීම කර්මාන්තය:</u>

උක්ත කරුණට අදාළව කාර්මික නිලධාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

කියැන්නැම් සමාගමෙන් ඉල්ලා ඇති ගල් ප්‍රමාණය ලබාගෙන ඉහත කී කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය වන ප්‍රමාණය ලබාදීමට තීරණය කරන ලදි.

03. වැලිහරනාව අතුරු මාර්ගය සංවර්ධනය කිරීම රු.806704.53
මෙම ඇස්තමේන්තුව අනුමත කිරීමට සභාව තිරණය කරන ලදී.

08. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u> : නැත

<u>යථා පරිදි කල් දී ඇති යෝජනා:</u> නැත

09. **<u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම:</u>**

2008.05.30 දින සභා රැස්වීමේ දී ගෙන ඇති තීරණය පරිදි, වරිපනම් අංශය සඳහා තක්සේරු නිවේදන 30000 ක් මුද්‍රණය කරගැනීම වෙනුවෙන් මිල ගනන් ලබාගන්නා ලද අතර, පහත සදහන් පරිදි මිල ගණන් ලැබී ඇති බව විෂය භාර නිලධාරිණිය සභාව වෙත වාර්තා කර ඇති බව ලේකම් මහතා මහතා සභාව වෙත දන්වන ලදී.

| | Narah computers Forms | packsco | The stationery shop | Business Forms |
|---|---|---|---|---|
| තක්සේරු නිවේදන 30000 ක් මුද්‍රණය කරවාගැනීම | 47125/- | 57615/- | 53820/- | 53958/- |

ඉහත මිළ ගණන් අතරින් අවම මිළ ඉදිරිපත් කර ඇති "Narah computers Forms" ආයතනයෙන් මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

10. **<u>යෝජනා</u>**

නැත

11. **<u>කාරක සභා වල වාර්තා සලකා බැලීම:</u>**

2008.07.09 වන දින පවත්වන ලද කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදුව, එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12. **<u>ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරීම:</u>**

2008 ජුලි මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | | |
|---|---|---|
| පුනරාවර්තන ගෙවීම් | රු. | 2789821.14 |
| වෙනත් ලැබීම් | | 1130367.60 |
| | | ----------- |
| මුළු ලැබීම් | | 3920188.74 |
| | | ======== |

ගෙවීම්-2008 ජුලි

| | |
|---|---|
| පුනරාවර්ථන ගෙවීම් | 2551985.59 |
| ප්‍රාග්ධන ගෙවීම් | 327584.75 |
| වෙනත් ගෙවීම් | 838455.20 |
| | ---------- |
| මුළු ගෙවීම් | 3718025.54 |
| | ======== |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

14. **<u>වෙනත් කරුණු:-</u>**

14:01 **<u>ගරු නාගරික මන්ත්‍රී - ඩබ්.විමලසේන මැතිතුමා:</u>**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බලගහමුල හංදියට විථි පහන් දෙකක් සවිකරන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙම සභාව සතු වාහනවල පළාත් සභා අපේක්ෂකයින්ගේ පෝස්ටර ඇලවීමට කටයුතු නොකරන ලෙසත් ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14:02 **<u>ගරු නාගරික මන්ත්‍රී - ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:</u>**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, මෙම නගර සභාව දිවයිනේ පළාත් පාලන ආයතන අතුරින් ආදර්ශමත් පළාත් පාලන ආයතනය ලෙස තේරී පත්ව තිබෙන නිසා රාජ්‍ය ආයතනවල නිලධාරීන් විශාල සංඛ්‍යාවක් දෛනිකව මෙම සභාවේ කටයුතු අධ්‍යයනය කිරීම සඳහා පැමිණෙන බවත්, ඔවුන්ට සභාව මගින් කෙරෙන සංග්‍රහ කටයුතු ද පිළිවෙලකට සිදුකිරීම ඉතා වැදගත් බවත් බව සඳහන් කරමින් සිය කථාව අවසන් කරන ලදී.

15. <u>අවසානය:</u>

<u>ගරු සභාපති.ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:</u>

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු උපසභාපතිතුමා,ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා හා ලේකම් මහතා වෙත සිය ස්තුතිය පළකරමින්,සැමට සුභ ප්‍රාර්ථනය කරමින් සභාවේ වැඩ කටයුතු 12.45 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.